## නැණ සයුර අධ්‍යාපනික වැඩසටහන
## උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
### සාධන මට්ටම අනාවරණය කර ගැනීමේ පරීක්ෂණය
### 2021 අධ්‍යයන වර්ෂය ( 2022)

**10 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය** **කාලය පැය 03 යි**

I පත්‍රය පිළිතුරු

| | | | |
|---|---|---|---|
| (1) - 4 | (11) - 4 | (21) - 1 | (31) - 2 |
| (2) - 2 | (12) - 4 | (22) - 1 | (32) - 4 |
| (3) - 1 | (13) - 3 | (23) - 4 | (33) - 1 |
| 4) - 1 | (14) - 1 | (24) - 3 | (34) - 1 |
| (5) - 3 | (15) - 2 | (25) - 2 | (35) - 3 |
| (6) - 4 | (16) - 2 | (26) - 3 | (36) - 2 |
| (7) - 1 | (17) - 4 | (27) - 4 | (37) - 4 |
| (8) - 3 | (18) - 1 | (28) - 1 | (38) - 3 |
| (9) - 2 | (19) - 3 | (29) - 2 | (39) - 2 |
| (10) - 1 | (20) - 2 | (30) - 3 | (40) - 1 |

II පත්‍රය පිළිතුරු

01. (i). මහල්ලෙක්, ලෙඩෙක්, මළකඳක්, පැවිදි රුවක්.

(ii). ඉන්ද්‍රිය සංවරය, සති සම්පජඤ්ඤය, සන්තුට්ඨිතා ගුණාංගවලින් දෙකක් තිබිය යුතුය.

(iii). මුණිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, රත්නත්‍රයප්‍රණාම ගාථා සන්නය, සතර බණවර සන්නය කෘතිවලින් දෙකක් නම් කර තිබිය යුතුය.

(iv). චාරිත්‍ර සීලය - වාරිත්‍ර සීලය / විරමණය - සමාදානය / සිරිත් විරිත් යන යුගලයන් ගෙන් එකක් නම් කර තිබිය යුතුය.

(v). බුදුරජුන්, පසේ බුදුරජුන්, මහ රහතුන් අතරින් දෙදෙනකු නම් කර තිබිය යුතුය.

(vi). මුසාවාදා, පිසුනාවාචා, ඵරුෂාවාචා, සම්පප්ඵලාපා යන්නෙන් දෙකක් හෝ එහි නිවැරදි අර්ථ දෙකක් තිබිය යුතුය.

(vii). කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යන්නෙන් දෙකක් තිබිය යුතුය.

(viii). ඇතෙක් හා වඳුරෙක්.

(ix). භික්ෂූන් 500 ක් / පාලි භාෂාව.

(x). සීගිරියේ හා හිඳගල විහාරයේ.

02. (i). සුපටිපන්න, උජුපටිපන්න, ඤායපටිපන්න, සාමීචිපටිපන්න, ආහුණෙය්‍ය... ආදී ගුණ නවයෙන් දෙකක් ලියා තිබිය යුතුය.

(ii). පාංශකූල ඉටුකිරීම, දාන සීල භාවනා පින්කම් කරවීම, බෝධි පූජා, පිරිත් පිංකම්, ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා පැවැත්වීම ආදී ආගමික කාර්යයන් තුනක් සඳහන් කළ යුතුය.

(iii). පවින් වැළැක්වීම, යහපත් ක්‍රියාවල යෙදවීම, හොඳ සිතින් අනුකම්පා කිරීම, අසා නොමැති දෙය කියා දීම, අසා ඇති දෙය වඩාත් පැහැදිලි කර දීම, සුගතියට මග කියා දීම... යන යුතුකම් ද ඇතුළත් කර ලියන ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

03. (i). සාමයෙන් සමගියෙන් සහයෝගයෙන් ජීවත් වීමයි / එකමුතුව කටයුතු කිරීමයි / ජාති, ආගම් භේදයෙන් තොරව සමගියෙන් ජීවත් වීමයි.

(ii). පංචසීලය, සතර සංග්‍රහ වස්තු (සිව් සඟරාවත්) සිව්බඹ විහරණ (සතර බ්‍රහ්ම විහරණ)

(iii). අතීතයේ සිටම ජාති, ආගම්, කුල භේදයෙන් තොරව කටයුතු කර ඇත . බෞද්ධ ආගමේ අනන්‍යතාව රැක ගනිමින් සෙසු ආගම් වලට ගරු කර ඇත . බුදු දහමට අමතරව වෙනත් ආගම් රට තුළ මුල්බැස ගැනීමට අවස්ථාව ලබාදී ඇත. ආගමික අනන්‍යතාවයන්ට ගරු කර ඇත . ගංවතුර සුනාමි වැනි ආපදාවන් හිදී භේදයෙන් තොරව උපකාර කර ඇත... මේ ආදී කරුණු ඇතුළත් පිළිතුරකට ප්‍රමාණවත් ලකුණු ලබා දෙන්න.

04. (i). ඇසල පොහොය /බරණැස් ඉසිපතන මිගදායේ දී.

(ii). දුක්ඛ දුක්ඛතා / විපරිණාම දුක්ඛතා / සංඛාර දුක්ඛතා.

(iii). පංචකාම සම්පත්තියට ගිජුවීම, ක්ෂණික ආහාරපාන වලට ලොල්වීම, අතෘප්තිකරව මුදල් පසුපස හඹා යෑම, භෞතික දියුණුව වෙනුවෙන් පමණක් කටයුතු කිරීම ආදිය නිසා එහි අවසානය දුකකින් කෙළවර වේ... මේ ආදී කරුණු උපයෝගී කරගෙන ලියන ලද පිළිතුරකට ප්‍රමාණවත් ලකුණු ලබා දෙන්න.

05. (i). ජීව පරිසරය / අජීව පරිසරය.

(ii). පෙළ පොතේ 90 පිටුවේ පහළ කොටස හා 91 පිටුවේ ඉහල කොටසේ ඇති කරුණු වලින් තුනක් ලියා තිබිය යුතුය.

(iii). රජගහනුවර පිහිටි සුන්දර ස්ථාන හා විශාලා මහනුවර පිහිටි සුන්දර ස්ථාන වර්ණනා කළ අයුරු පෙළ පොතේ 92 පිටුවේ දැක්වේ. එම කරුණු ද ඇතුළුව ලියූ ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

06. (i). ඡන්ද, ද්වේෂ, භය, මෝහ.

(ii). දස සක්විතිවත්, සප්ත අපරිහානිය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති යන පාලන ධර්මවලින් තුනක් ලියා තිබිය යුතුය.

(iii). දානය,ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය යන සතර සංග්‍රහ වස්තු විස්තර කරමින් ඉන් රටේ ජනතාවට සිදුවන යහපත පෙන්වා දුන් පිළිතුරකට ප්‍රමාණවත් ලකුණු ලබා දෙන්න. පෙළ පොතේ 128 පිටුව ද මේ සඳහා පරිශීලනය කරන්න.

07. (i). නිවන වලකාලන, නිවනට බාධා කරන ධර්ම නීවරණවේ.

කාමච්ඡන්දය - කාමවස්තු කෙරෙහ ඇති ආශාව වර්ණ ගැන්වූ ජලයට උපමා කර ඇත. ව්‍යාපාද - සිතෙහි හටගත් තරහව රත් වී උතුරා බුබුලු දමන ජලයට උපමා කර ඇත . ථිනමිද්ධ - සිතෙහි කයෙහි ඇති උදාසීන බව, නිදිමත, කම්මැලි බව පාසි සහිත ජලයට උපමා කර ඇත .උද්ධච්ඡ කුක්කුච්ඡ - සිතෙහි ඇතිවන නොසන්සුන්කම, කැළඹුණු ජලයට උපමා කර ඇත . විචිකිච්ඡා - සැකයයි. බොර වූ ජලයට උපමා කර ඇත . යන කරුණුද ඇතුළත් පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

(ii). මව - විහාර මහා දේවිය, පියා - කාවන්තිස්ස රජු, සහෝදරයා - සද්ධාතිස්ස ය. රුහුණේ ඉපදුණි. අනුරාධපුර රජකළ එළාර දවිඩ රජු සමග යුද්ධ කර රට එක්සේසත් කළේය. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය..." අභීත සටන් පාඨය අනුව ක්‍රියා කර ඇත . රුවන්වැලි සෑය, ලෝවාමහාපාය, මිරිසවැටිය ඉදිකළේ ය. තවත් වෙහෙර විහාර 68 ක් ඉදි කළ බව දැක්වේ. පිං පොත ලියු රජෙකි. දුටුගැමුණු චරිතයෙන් ගත හැකි ආදර්ශ බොහෝය... කරුණුද ඇතුළත් පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

(iii). සිඟාලෝවාද සූත්‍රයේ භෝග විනාශ මුඛ 06 ක් දැක්වේ.

මදයට ප්‍රමාදයට හේතුවන මධ්‍යසාර ගැනීම.

නුසුදුසු වෙලාවේ මංමාවත්වල සැරිසැරීම.

නැටුම්, ගැයුම්, වැයුම් හි ලොල් බව.

සූදුවෙහි යෙදීම.

පවිටු මිතුරන් ඇසුර.

අලසකමින් කල්ගෙවීම යන කරුණු විස්තර කරමින් ලියූ පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

(iv). සඳකඩ පහණ අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා නිර්මාණය වූ කලා කෘතියකි. පාලියෙන් අඩ්ඪ චන්ද පාෂාණ නමින් හඳුන්වයි.ලංකාවේ කලාත්මකම සඳකඩපහණ අනුරාධපුර බිසෝ මාලිගය අසලින් හමු වී ඇත. ශෛලිගත, පලාපෙති, ඇත්, අස්, සිංහ, ගව, සතුන්, සංකීර්ණ ලියවැල, තුඩින් නෙලුම් මල් හංස පේළි, සරල ලියවැල පිලිවෙලින් සඳකඩපහණේ දක්නට ඇත .පොළොන්නරු යුගයේ දී හින්දු ආගමේ බලපෑම් මත ගවයා සඳකඩපහණෙන් ඉවත් කර ඇත . මහනුවර යුගයේ සඳකඩපහණ කැටයම් වලින් හා හැඩයෙන් ද වෙනස් වී ඇත. අනුරාධපුර යුගයට අයත් සඳකඩ පහනින් භවචක්‍රය අර්ථවත් කරන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පවසයි... මේ කරුණු ඇතුලත් පිළිතුරකට ලකුණු ලබා දෙන්න.